රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 46/90 (III)

මගේ අංකය:- EST-3/CERTI/06/9410
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2010.01.15

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්

**බඳවා ගැනීමේ පරිපාටිවලට ඇතුළත් කළයුතු වෙනත් අධ්‍යාපනික සුදුසුකම්**

ඉහත මැයෙන් නිකුත් කර ඇති 1990.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ III, IV, V හා VI ජේද කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරවන අතර, එම වගන්තිවල සඳහන් පාඨමාලා පැවැත්වීම 1995 අංක 29 දරණ **ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනත** මගින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත පැවරී ඇත. ඒ අනුව ඉහත ජේද යටතේ සඳහන් **"ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ"** යන්න**"ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ"** වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

03. තවද මහරගම ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමනු ලබන අධ්‍යාපනවේදි උපාධිය ශ්‍රී ලංකාවේ අනෙකුත් පිළිගත් විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන සමාන කාල පරිච්ඡේදයකින් යුත් අධ්‍යාපනවේදි උපාධියකට සමාන ලෙස පිළිගෙන ඇති බවද දන්වනු කැමැත්තෙමි.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය